

පූජනීය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේ
මෙහෙයවන

# මාසික තරුණ දහම් හමුව

**සිරි සුදස්සනාරාම මහ වෙහෙර**

පන්නිපිටිය පාර - බත්තරමුල්ල

## අතිපූජ්‍ය ආචාර්ය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේ මෙහෙයවන මාසික තරුණ දහම් හමුව

**සෑම මසකම අවසාන ඉරිදා සවස 3 සිට 5 දක්වා**

තරුණ මනස සාමාන්‍යයෙන් ආවේගකාරියි. සමහර තරුණ දරුවන් සිතින් ආවේගකාරියි. සමහරු වචනයෙන් ආවේගකාරියි. තවත් සමහරුසිත, වචනය හා ක්‍රියාව නම් තුන් ආකාරයෙන්ම කලබලයි. ආවේගශීලියි. ජීවිතය වඩාත් පහසු වන්නේ සන්සුන්වූ තරමටය. එනම් මනසින් සංවර වූ තරමටය. කැඩපතක දූවිලි බැඳී ඇත්නම් මැනවින් මුහුණ නොපෙනේ. කලබලකාරී හෝ පීඩිත සිතකින් ජීවිතය දෙස නිවැරදිව බැලිය නොහැකිය. වරද හා යහපත පවා නිවැරදිව නොපෙනේ. එවිට ජීවිතය එකම අවුලකි. ''මට දැන් ඔක්කොම එපා වෙලා''යි පවසන්නේ මෙහි එක් ආදීනවයක් හැටියටය. ලොව සියලු දෑ තුළ ඇති ''වෙනස්වීම හෙවත් දිරාගෙන යාම'' අවබෝධයෙන් දැන විරාගී මනසක් ඇති කර ගැනීම යහපත්ය. එහෙත් අරමුණු ඉටු නොවන විට හා බලාපොරොත්තු කඩවන විට තරහවෙන්, වෛරයෙන් හෝ අමනාපයෙන් මතුවෙන ''එපාවීම'' අකුශලයකි. එම සිතුවිල්ල තමන්ටම පළමුව විපත් ගෙන දිය හැකිය. ජීවිතය හැබෑවටම තේරුම් ගැනීම සඳහා ලොව පහළ වූ ශ්‍රේෂ්ඨතම මනුෂ්‍ය රත්නයක් වූ බුදුරජාණන් වහන්සේගේ උතුම් අදහස් හා මග පෙන්වීම් විමසා බලන්නට ඔබත් අප හා එක්වන්න.

**පූජනීය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේ**

## අරමුණ :-

තරුණ කාලය ජීවිතයේ දුකින් විඳවීමකට හේතුවක් නොවීමට තථාගත බුදුරදුන්ගේ වටිනා ධර්මය මගින් අවස්ථාවක් ලබාදීමය. තාවකාලිකවූත්, ඇස්බැන්දුම් බඳුවූත් මායාකාරී අරමුණු වලට නොරැවටී ජීවිතය ගැඹුරින් තේරුම් ගැනීමට ධර්මය සාකච්ඡා කිරීමයි.

## කවුරුන් උදෙසා ද ?

වැරදි හදන්නට පෙර වටිනා ජීවිතය ගැන සිතනා තරුණ දරුවන් උදෙසාය. අළුතින් යමක් නිවැරදිව සිතන්නට හා අනුගමනය කරන්නට උත්සාහ ගන්නා තරුණ දරුවන් වෙනුවෙනි. එහෙත් වැඩිහිටි සියළු දෙනාටම සහභාගී විය හැකිය. අවශ්‍ය කරන්නේ ධර්මය විමසා බැලීමටත් එය අනුගමනය කිරීමටත් ඇති කැමැත්තයි

## දිනය, වේලාව සහ ස්වභාවය :-

සෑම මසකම අවසන් ඉරිදා සවස 3 සිට 5 දක්වායි. තෙරුවන් ගුණ වන්දනාව, සූත්‍ර විස්තරයක්,සාකච්ඡාව හා කෙටි භාවනාවක් ද ඇතුලත් වේ.

## විශේෂිත කරුණු :-

ඔබ පිරිසිදු හා චාම් සුදු ඇඳුමකින් සැරසීම වඩා වැදගත්ය. එම ඇඳුම ආරාමික පරිසරයකට ගැලපීම අත්‍යවශ්‍යය.

**"කුල්ලූපමං වෝ භික්ඛවේ ධම්මං දේසිස්සාමි නිත්තරණත්ථාය නො ගහණත්ථාය"**

"මහණෙනි, මම ධර්මය ඔරුවකට උපමා කොට ඔබට දේශනා කරන්නෙමි. ධර්මය එතෙර වීම පිණිසයි. කරගහගෙන යෑම පිණිස නොවේ."

බුදුරජාණන් වහන්සේ.
(මජ්ඣිම නිකාය - අලගද්දූපම සූත්‍රය)



**සිරි සුදස්සනාරාම මහ වෙහෙර**
**පන්නිපිටිය පාර - බත්තරමුල්ල.**
**දුරකථන : 2862389**



graphics dehiwala 0712 316 716